# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2104/31 - 2019 ජනවාරි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2019.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 13/2017.

### ණය සහනදායක ආඥාපනත (81 වන අධිකාරය වූ)

(81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 6 වන සහ 10 වන වගන්ති යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ක් වූ ජූලි මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. කලින් කල සංශෝධිත 1942 ජූලි මස 31 වැනි දින අංක 8979 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද 1942 ණය සහනදායක නියෝග පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 3 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝග ආදේශ කිරීමෙන් :-

"3. (1) මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයක රැස්වීමකට පැමිණෙන මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයක සෑම සාමාජිකයකුටම එක් එක් රැස්වීම සම්බන්ධයෙන් රුපියල් තුන්දහසක ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීමකට පැමිණෙන මණ්ඩලයේ සභාපතිවරයාට එක් එක් රැස්වීම් වාරය සම්බන්ධයෙන් රුපියල් පන්දහසක ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.";

(2) එහි 4 වන නියෝගයේ -

(*අ*) එම නියෝගයේ (1) වන ඡේදයේ (ii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(ii) රැස්වීමකට පැමිණීම සඳහා සාමාජිකයෙකු විසින් මෝටර් වාහනයක් භාවිත කරන අවස්ථාවක එක් රැස්වීමකට රුපියල් දහසක් බැගින් ද, සභාපතිවරයා සම්බන්ධයෙන් වන විට එක් රැස්වීමකට රුපියල් දෙදහස බැගින් ද,".

2. මේ නියෝග 2017 නොවැම්බර් මස 1 වැනි දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

01 - 365

1A - G 29188— 18 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*